DOI : 10.31357/fhssmst.2012.00651

# ස්වභාවික විපත් වර්ධනය වීමෙහිලා අවිධිමත් ඉඩම් පරිහරණයේ බලපෑම

(ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

කුඩා ගමගේ සිරන්ත

**GS/MAT/Geo/3306/08**

**1702SS2008007**

ශාස්ත්‍රපති

2012

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
10 JUN 2013

# ස්වභාවික විපත් වර්ධනය වීමෙහිලා

# අවිධිමත් ඉඩම් පරිහරණයේ බලපෑම

(ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ඇසුරින්)

කුඩා ගමගේ සිරන්ත

**GS/MAT/Geo/3306/08**

**1702SS2008007**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපදිෂ්ට ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

(භූගෝල විද්‍යාව) සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයයි

## අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම නිබන්ධයේ අන්තර්ගතය ආචාර්ය පින්නවල සංඝසුමන හිමියන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

2013/06/10
දිනය

(කේ. පී.සිරන්ත)

## සුපරීක්ෂකගේ සහතිකය

වාචික පරීක්ෂණයේදී පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියළු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂකයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමි.

2013.06.10
..........................

දිනය

..........................

සුපරීක්ෂකගේ අත්සන

ආචාර්ය පින්නවල සංඝසුමන හිමි
අධ්‍යයනාංශ ප්‍රධාන
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

## පටුන

පිටු අංකය


I. පටුන i-iii

II. සිතියම්, වගු, ප්‍රස්තාර හා රූප සටහන් නාමාවලිය iv- vii

III. ස්තුතිය viii

IV. නිබන්ධ සාරාංශය ix-x


### පළමුවන පරිච්ඡේදය

#### හැඳින්වීම


1.1 අධ්‍යයනයේ පසුබිම 01- 07

1.2 පර්යේෂණයේ වැදගත්කම 08 - 08

1.3 පර්යේෂණ ගැටලුව 09 - 09

1.4 පර්යේෂණයේ අරමුණු 09- 09

1.5 කල්පිතය 09 - 09

1.6 ක්‍රමවේදය 09 - 10

1.6.1 අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීම 11 - 12

1.6.2 දත්ත රැස්කිරීම (දත්ත පදනම) 12 - 12

1.6.3 ප්‍රාථමික දත්ත 13 - 14

1.6.4 ද්විතියික දත්ත 14 - 14

1.7 දත්ත විශ්ලේෂණය 15 - 17

1.8 අධ්‍යයනයේ සීමා 18 - 18

පිටු අංකය

## දෙවන පරිච්ඡේදය

### සාහිත්‍ය විමර්ශනය


| | |
|---|---|
| 2.1 ප්‍රවේශය | 19 - 20 |
| 2.2 ඉඩම් පරිහරණය හා සම්බන්ධ විවිධ මානයන් | 20 - 25 |
| 2.3 ස්වාභාවික විපත් වර්ධනය වීම හා අවිධිමත් ඉඩම් පරිහරණය | 25 - 30 |
| 2.4 ශ්‍රී ලංකාවේ ගංවතුර හා නායයෑම් කෙරෙහි අවිධිමත් ඉඩම් පරිහරණයේ බලපෑම | 30 - 36 |
| 2.4.1 නායයාම් සිදුවීමේ සම්භාවිතාවය හඳුනාගැනීමේ වර්ගීකරණය | 36 - 36 |
| 2.5 ස්වාභාවික විපත් අවම කිරීමෙහි ලා ඉඩම් පරිහරණ සැළසුම්කරණයේ වැදගත්කම | 37 - 39 |
| 2.5.1 ජාතික සැළසුම් සම්පාදනය | 39 - 40 |
| 2.5.2. පලාත් හා දිස්ත්‍රික් මට්ටම | 41 - 41 |
| 2.5.3. ප්‍රාදේශීය මට්ටම | 41 - 41 |
| 2.5.4. ග්‍රාමීය හා ක්ෂුද්‍ර මට්ටම | 42 - 43 |


## තුන්වන පරිච්ඡේදය

### අධ්‍යයන ප්‍රදේශය


| | |
|---|---|
| 3.1 පිහිටීම | 44 - 44 |
| 3.2 භූගෝලීය පසුබිම | 44 - 44 |

3.2 .1 භූ විෂමතාව 44 - 49

3.2.2. ජල වහනය 50 - 50

3.2.3. දේශගුණය 50 - 52

3.2.4. ස්වාභාවික වෘක්ෂලතා 52 - 53

3 .3 සමාජ ආර්ථික පසුබිම

3.3.1. ජනගහනය 53 - 56

3.3.2. අධ්‍යාපන මට්ටම හා ක්‍රියා ව්‍යුහය 57 - 58

3.3.3. නිවාසවල ස්වභාවය හා ආදායම් මට්ටම 58 - 60

3.3.4. මාර්ග පද්ධතිය 60 - 61

**හතරවන පරිච්ඡේදය**

**අවිධිමත් ඉඩම් පරිහරණය ගංවතුර හා නායයාම් කෙරෙහි ඇති කරන බලපෑම**

4.1 ඉඩම් පරිහරණය හා එහි කාලීන වෙනස් වීම 62 - 71

4.2 අධ්‍යයන ප්‍රදේශයේ ගං වතුර හා නායයෑම් බලපෑම 71 - 79

4.3 අධ්‍යයන ප්‍රදේශයේ ඉඩම් පරිහරණය හා ස්වාභවික විපත් අතර බන්ධුතාවය 80 - 89

**පස්වන පරිච්ඡේදය**

**නිගමන හා යෝජනා**

4.2 නිගමන 90 - 94

4.3 යෝජනා 94 - 97

**ආශ්‍රිත ග්‍රන්ථ** 98 - 102

ඇමුණුම

## සිතියම්, වගු, ප්‍රස්තාර හා රූප සටහන් නාමාවලිය

**සිතියම්** **පිටු අංකය**


3.1 සිතියම අධ්‍යයන ප්‍රදේශයේ පිහිටීම 45

3.2 සිතියම භූ විෂමතාවය හා ජලවහනය යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය 46

3.3 සිතියම අධයයන ප්‍රදේශයේ බෑවුම් කලාප 2011 49

3.4 සිතියම අධයයන ප්‍රදේශයේ ජන ඝනත්වය 2011 56

3.5 සිතියම මාර්ග රටාව යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය 61

4.1 සිතියම යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණය 1983 69

4.2 සිතියම අධයයන ප්‍රදේශයේ ඉඩම් පරිහරණය 2010 70

4.3 සිතියම භූමි තත්ව දර්ශක සිතියම, යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය 83

4.4 සිතියම ගං වතුර බලපෑම පිළිබඳ පුරෝකථන සිතියම 2011 87


වගු


1.1 වගුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක ගංවතුර හා නායයෑම් බලපෑම,2003 06

1.2 වගුව යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර හා නායයෑම් වලට ලක්වූ පවුල් හා ඉඩම් කට්ටි කරුවන් ප්‍රමාණය, 2003 -2009 07

2.1 වගුව භූමි තීව්‍රතා ඒකක හා ඒවාට ඇතුලත් වන පරිහරණයන් 22

2.2 වගුව ප්‍රාදේශීය භූමි තත්ව දර්ශක සිතියම් සුචිය (Indicative Land Use map) 23

පිටු අංකය

2.3 වගුව ගංවතුර වර්ගීකරණය 33

2.4 වගුව ශ්‍රී ලංකාවේ නායයෑම් සහ ගංවතුර නිසා සිදු වූ හානිය ,2003 36

3.1 වගුව යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෑවුම් කලාප හා
බිම් ප්‍රමාණය (2000) 48

3.2 වගුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්ෂික වර්ෂාපතනය 2001 - 2011 51

3.3 වගුව කොට්ඨාසයේ වාර්ෂික උෂ්ණත්වයේ වෙනස්වීම 52

3.4 වගුව ග්‍රාම නිළධාරි වසම් අනුව ජනසංඛ්‍යාව 2001/2011 53/54

3.5 වගුව නියදි ප්‍රදේශයේ ජනගහණය හා මිනිස් භූමි අනුපාතය 2011 55

3.6 වගුව නියදි ප්‍රදේශයේ අධ්‍යාපන මට්ටම 2011 58

3.7 වගුව නියදි ප්‍රදේශයේ ආදායම් මට්ටම 2011 59

4.1 වගුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණය 2010 63

4.2 වගුව කොට්ඨාසයේ රක්ෂිත ඉඩම් අනවසරයෙන්
පරිහරණය කිරීම 2009 65

4.3 වගුව යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණය ) 1983 66

4.4 වගුව යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණයේ
කාලීන වෙනස්වීම 1983-2010 67

4.5 වගුව යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ
ගංවතුර බලපෑ වාර ගණන 2000 ,2011 71

4.6 වගුව ප්‍රදේශයේ ගංවතුර බලපෑම - උස ප්‍රමාණය අනුව 2003 72

4.7 වගුව යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ
ගංවතුර හා නායයෑම් බලපෑම, 2010 සිට 2011 දක්වා 73

පිටු අංකය

4.8 වගුව නියඳි ප්‍රදේශයේ ගංවතුර හා නායයාම් බලපෑම 74

4.9 වගුව යක්කලමුල්ල ප්‍රාදේශී ලේකම් කොට්ඨාසයේ මාසික

වර්ෂාපතන හා තෙත් සහිත දින ගනන් 2002-2010 74

4.10 වගුව ආදායම් මට්ටම් පහත වැටීම, 2005 සිට 2010 දක්වා 76

4.11 වගුව නියඳි ප්‍රදේශයේ ගංවතුර හා නායයාම් බලපෑම නිසා

හානි සිදු වූ වගා බිම් ප්‍රමාණය -2003 77

4.12 වගුව ග්‍රාම නිළධාරි වසම් කිහිපයක ගං වතුර හා නායයාම්

බලපෑම නිසා හානි සිදු සිදු වූ සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණය -2003 78

4.13 වගුව නියඳි ප්‍රදේශයේ ඉඩම්වල කළමණාකරන

මට්ටම අනුව පවුල් ප්‍රමාණය , 2011 80

4.14 වගුව ඉඩම් පරිහරණ ගැටලුවල බලපෑම ,2011 80

4.15 වගුව භූමි තත්ව දර්ශක සිතියම අනුව කොට්ඨාසයේ

ඉඩම් පරිහරණය හා බිම් ප්‍රමාණය 2010 82

4.16 වගුව ගංවතුර ඇතිවීමට බලපෑ හේතු 86

ප්‍රස්තාර

3.1 ප්‍රස්තාරය යක්කලමුල්ල කොට්ඨාසයේ වාර්ෂික වර්ෂාපතනය 2001 - 2011 දක්වා 51

3.2 ප්‍රස්තාරය නියඳි ප්‍රදේශයේ රැකියා ව්‍යූහය - 2011 57

3.3 ප්‍රස්තාරය නියඳි ප්‍රදේශයේ නිවාසවල ස්වභාවය ,2011 59

4.1 ප්‍රස්තාරය ඉඩම් අයිතිය, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ,2010 64

රූප සටහන්

1.1 රූපසටහන පර්යේෂණයේ ව්‍යූහය 10

1.2 රූපසටහන අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීම හා නියැදීම 15

1.3 රූපසටහන දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම 17

පිටු අංකය

2.1 රූපසටහන ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදන මට්ටම් 40

ඡායාරූප

4.1 ඡායාරූපය බෑවුම් ප්‍රදේශයක අවිධිමත් ඉදිකිරීම්,
නාකියාදෙණිය ග්‍රාම නිළධාරි වසම 68

4.2 ඡායාරූපය පොල්පාගොඩ බටහිර ග්‍රාම නිළධාරි වසමේ
අඹ කඩය අසල ගං වතුර බලපෑම 68

4.3 ඡායාරූපය බෙරණාගොඩ ග්‍රාම නිළධාරි වසමේ
පීල්ල වංගුව අසල නායයාම් සිදු වූ ස්ථානයක් 79

4.4 ඡායාරූපය අවිධිමත් ලෙස භූමිය කැපීම් කරන ලද ස්ථානයක්
පොල්පාගොඩ වැරණියහේන 79

4.5 ඡායාරූපය අවිදිමත් ඉඩම් පරිහරණය නිසා හායනයට පත්
වගා බිමක් - පොල්පාගොඩ බටහිර ග්‍රාම නිළධාරී වසම 89

4.6 ඡායාරූපය ගංගා රක්ෂිත එළිපෙහෙළි කිරීම පහල වල්පල ග්‍රාම නිළධාරි වසම 89

# ස්තුතිය

මෙම ස්වාධීන නිබන්ධය සඳහා සුපරීක්ෂක වශයෙන් කටයුතු කරමින් නිබඳවම මා දිරිමත් කොට මෙතෙකින් නොනැවතී ඉදිරිය දකින්නට මා යොමු කළ භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ අංශ ප්‍රධාන ආචාර්ය පින්නවල සංඝසුමන ස්වාමීන් වහන්සේට ගෞරවනීය ස්තුතිය පුද කරමි.

එමෙන්ම සම්න්ත්‍රණ පරීක්ෂක ලෙස කටයුතු කරමින් උපදෙස් ලබාදුන් විශ්‍රාමික මහාචාර්ය එම්. ඩී. සී. අබේරත්න මැතිඳුන් ඇතුළු භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ සියළුම ගුරු භවතුන්ටත් ස්තුතිය පුද කරමි.

මෙම ස්වාධීන නිබන්ධය සඳහා අනුමත ප්‍රතිපාදන ලබා දෙමින් සහය දැක්වූ ඉඩම් පරිහරණ සැළසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා ශාන්ති ප්‍රනාන්දු මැතිණියටත්, ගාල්ල දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිළධාරී එච්. එම්. චන්ද්‍රසේන මහතාටත් විවිධ අයුරින් සහය දැක්වූ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිළධාරී සිසර මයාටත් මාගේ ස්තුතිය පුදකරමි.

සිතියම් සැකසීම සඳහා සහය වූ හර්ෂි තිලකරත්න මිය හා පරිඝණක කටයුතුවලදි සහය වූ නිසංසලා නැගණියද මෙම කාර්යයේදි මා හට නිබඳ සහයක් වූ මා බිරිඳ රේණුකා ද මෙහිදි සිහිපත් කරමි.

# ස්වාභාවික විපත් වර්ධනය වීමෙහි ලා අවිධිමත් ඉඩම් පරිහරණයේ බලපෑම

(ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

කුඩා ගමගේ සිරන්ත

## සාරසංක්ෂේපය

ස්වභාවික ආපදා වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක කාලීන හා අවකාශීය වශයෙන් විවිධත්වයක් ගනී. කිසියම් ව්‍යසනයකින් සිදුවිය හැකි බලපෑම අවම කිරීම ආපදා කළමණාකරනයේ එක් අවස්ථාවක් වන බැවින්, එබඳු විපත් වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක විශ්ලේෂණය කිරීම කෙරෙහි වර්තමානයේ සුවිශේෂ අවධානයක් යොමුව තිබේ. ශ්‍රී ලංකාවේ සෘතුමය වශයෙන් සිදුවන ස්වභාවික අපදා අතර වැඩිම බලපෑමක් සිදු කරන්නේ ගංවතුර හා නායයෑම් ය. කාලීන හා ප්‍රාදේශීය වශයෙන් එහි තීව්‍රතාවයත්, සංඛ්‍යාතයත්, විනාශකාරී බවත් වෙනස් වන බැවින් අපදා කළමනාකරනයේ දී ඒ පිළිබඳව වඩාත් අවධානය යොමු කළ යුතුය. පොදුවේ සලකන කල ශ්‍රී ලංකාවේ ගංවතුර හා නායයෑම් කෙරෙහි බලපාන භෞතික සාධක පිළිබඳව පුළුල් අවධානයක් යොමු කර ඇතත් විශේෂිත මානව සාධක පිළිබඳව සිදු කර ඇති අධ්‍යයනයන් සීමා සහිතය. ජන සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයත් සමග ස්වභාවික පරිසරය කෙරෙහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම ප්‍රබල වීම හේතුවෙන් විවිධ පරිමාණයේ ගැටළු උද්ගත වෙමින් පවති. ඒ අතරින් ගංවතුර හා නායයාම් විපත් වර්ධනය වීම, ශ්‍රී ලංකාව මුහුණ පාමින් සිටින ප්‍රබල අභියෝගයක් වශයෙන් හැඳින්විය හැකිය. මේ සඳහා සෘජු ලෙසම බලපානු ඇතැයි සැලකෙන මානව සාධක අතර 'අවිධිමත් ඉඩම් පරිහරණය' තීරණාත්මක සාධකයක් වන්නේද? යන පර්යේෂණ ගැටළුව පදනම් කරගෙන මෙම අධ්‍යයනය සිදු කර තිබේ. පවත්නා භූමි තත්වයන්ට හා ගුණාංගවලට අනුකූල වන පරිදි ප්‍රශස්ත මට්ටමේ ඉඩම් පරිහරණයක් පවත්වා ගෙන යාමේ දී මතුවන ගැටළු හඳුනා ගැනීමත්, අවිධිමත් ලෙස සිදු කරන ඉඩම් පරිහරණය කිනම් පරිමාණයකින් ගංවතුර හා නායයාම් වර්ධනය වීම කෙරෙහි

හේතු වී තිබේද යන්න පරීක්ෂා කිරිමත්, මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ. එම අරමුණු සපුරා ගනු වස් ප්‍රමාණාත්මක ක්‍රම ශිල්ප පදනම් කරගත් පර්යේෂණ ක්‍රමවේදයක් මෙහි දී අනුගමනය කර ඇත. දත්ත විශලේෂණයේ ප්‍රතිඵල සාකච්ඡා කිරීමේ දී ගුණාත්මක දත්ත හා තොරතුරු ද භාවිතයට ගෙන තිබේ. ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රයෙන් සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින් කොට්ඨාසයේ භූමි තත්ව දර්ශක සිතියම යාවත්කාලීන කරන ලද අතර ඒ ඇසුරින් ඉඩම් පරිහරණයේ සුවිශේෂ ලක්ෂණ විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනය මගින් අනාවරණය කෙරෙන තවත් කරුණක් වන්නේ ගංවතුර හා නායයාම් වර්ධනය වීම කෙරෙහි අවිධිමත් ඉඩම් පරිහරණය බලපා ඇත්තේ විවිධාකාරයට බවයි. ප්‍රදේශයේ ගංවතුර හා නායයාම්වල තීව්‍රතාව හා විනාශකාරී බව වැඩිවීමට මිස ඒවායේ සංඛ්‍යාතය වර්ධනය වීමට සෘජු ලෙසම අවිධිමත් ඉඩම් පරිහරණය බලපා නැත. කළමණාකරන මට්ටම අනුව ඉඩම් පරිහරණයේ ප්‍රාදේශීය විවිධත්වයක් දක්නට ලැබෙන අතර ඒ කෙරෙහි බලපා ඇති විවිධ සාධක පිළිබඳව මෙම පර්යේෂණ නිබන්ධයේ පුළුල් ලෙස සාකච්ඡා කර ඇත.

ප්‍රමුඛ පදඃ ආපදා කළමණාකරනය, ගංවතුර, නායයාම්, අවිධිමත් ඉඩම් පරිහරණය

# පළමුවන පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 අධ්‍යයනයේ පසුබිම

ජනගහන වර්ධනයත් සමගම මිනිස් අවශ්‍යතා සහ ක්‍රියාකාරකම්වල ඇතිවන වර්ධනය නිසා භූමිය සීමිත සම්පතක් බවට පත්ව ඇත. විවිධ අවශ්‍යතා සඳහා භූමිය කෙරෙහි ඇතිවන ඉල්ලුම හේතුවෙන් වඩාත් උචිත භූමි පරිහරණයක් හඳුනා ගැනීමත්, දැනට පවතින අවිධිමත් ඉඩම් පරිහරණය නිසා පැන නැගී ඇති ස්වභාවික විපත් ඇතුළු වෙනත් ආපදා අවම කර ගැනීමත් කාලීන අවශ්‍යතාවයක් ව පවතී.

ස්වභාවික විපත් සඳහා පෙර සූදානම් කිරීමේ ආසියානු මධ්‍යස්ථානය *(Asian Disaster Preparedness Center, 2007)* දක්වන අන්දමට මිනිසාට පීඩාවක් හෝ පාඩුවක් ඇති වීමට ඉඩකඩ පවතින ස්වභාවික සංසිද්ධියක් ස්වභාවික උපද්‍රවයක් ලෙස හඳුන්වා දී තිබේ. එම ආයතනය විසින් දක්වා ඇති වර්ගීකරණයට අනුව ස්වභාවික විපත් පහත පරිදි වර්ගීකරණය කර ඇත.

1. දේශගුණික උපද්‍රව ( ගං වතුර, නියඟය, වාසුළි )
2. භූ භෞතික හා භූ විද්‍යාත්මක උපද්‍රව (භූමි කම්පා, සුනාමි, යමහල්, නායයෑම්, හිම කඳු කඩා වැටීම්)
3. ජීව විද්‍යාත්මක උපද්‍රව (ලැව් ගිනි, මානව රෝග, වසංගත, සත්ව රෝග, කෘමි උවදුරු)

මේ හැරුණු විට ස්වභාවික උපද්‍රව වර්ධනය වීම කෙරෙහි ගතවන කාලය හා ස්වාභාවික විපත්වල ප්‍රබලතාවය අනුවද ඒවා වර්ග කළ හැකිය. කාලය අනුව ස්වභාවික විපත් පහත පරිදි වර්ග කළ හැකිය.

1. ක්ෂනිකව වර්ධනය වන උපද්‍රව (භූමි කම්පා, නායයෑම්, ටොනාඩෝ)
2. කෙටි කාලයක් තුල වර්ධනය වන උපද්‍රව (සුනාමි, නිවර්තන වාසුළි, ගං වතුර)
3. දිගු කලක් තුල වර්ධනය වන උපද්‍රව (නියඟය)

ස්වභාවික විපත් සිදුවීමේ ප්‍රබලතාවය අනුව,

1. අඩු ප්‍රබලතාවයක් සහිත උපද්‍රව
2. මධ්‍යස්ථ ප්‍රබලතාවයක් සහිත උපද්‍රව
3. දැඩි ප්‍රබලතාවයක් සහිත උපද්‍රව

වශයෙන් වර්ග කර දැක්විය හැකිය. (රත්නායක 2007)